චක්‍රලේඛ අංක :- 05/2014

මගේ අංක :- ඩබ්/පුද්:සං/2014
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2014.01.17

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත,

**<u>නේවාසික අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් සහ උපදේශන සේවා වැඩසටහන් සංවර්ධනය කිරීම - 2014</u>**

බන්ධනාගාරගතවන්නන් යහපත් පුරවැසියන් පිරිසක් ලෙස නැවත සමාජ ගත කිරීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරනු ලබන පුනරුත්ථාපන වැඩසටහන් වල පදනම වන්නේ ඔවුන් තුල යහපත් මානසික සංවර්ධනයක් ඇති කිරීමයි. යහපත් මානසික සංවර්ධනයක් ඇති කිරීම තුලින් යහපත් ආකල්ප වලින් හෙබි යහපත් පෞර්ෂයකින් යුතු සමාජයට වැඩදායි පිරිසක් සමාජ ගතකල හැකිය. මෙකී අරමුණ පෙරදැරිකරගෙන දෙපාර්තමේන්තුව මෑත කාලීනව ව්‍යාපෘතීන් රාශියක් දියත් කර ඇත.

02. විශේෂයෙන්ම එකී ව්‍යාපෘතීන්හි සාර්තක භාවය තීරණය වන්නේ ඔබ ආයතනය තුල එම වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙන කාර්යක්ෂමතාවය මතය. බන්ධනාගාර සංඛ්‍යා ලේඛන වලින් හෙලි වන කරුණක් වන්නේ නැවත බන්ධනාගාර ගතවීමේ අනුපාතය ඉහල අගයක් ගන්නා බවයි. මෙම තත්වය බන්ධනාගාර තදබදයටද උග්‍ර ලෙස බලපෑම් ඇති කරයි. මෙවන් තත්වයට නේවාසිකයා පත්වීමට එක් කරුණක් වන්නේද පුනරුත්ථාපන වැඩසටහන් වල පවතින අඩුලුහුඩුකම්ය.

03. යහපත් මානසික සංවර්ධනයක් නේවාසිකයින් තුල ඇති කිරීම සඳහා අධ්‍යාත්මික වශයෙන් ඔවුන්තුල සංවර්ධනයක් ඇති කිරීමට කටයුතු කිරීමත්, සාර්ථක උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්, වැදගත්ය. අධ්‍යාත්මික සංවර්ධනය තුලින් හා සාර්ථක උපදේශන වැඩසටහන් තුලින් යහපත් හැසිරීම් රටාවකට නේවාසිකයින් යොමු කරලීමට හැකි වීම පුනරුත්ථාපන වැඩසටහන් වල කාර්යක්ෂමතාවය මැනවින් පෙන්නුම් කරන කරුණකි.

04. එබැවින් ඔබ ආයතනය තුල දැනට ක්‍රියාත්මක කෙරෙන අධ්‍යාත්මික සහ උපදේශන වැඩසටහන් වඩාත් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට පහත සඳහන් පරිදි අවශ්‍ය පියවර ගන්නා ලෙසට උපදෙස් දෙමි.

I. එහිදී දැනටමත් ඔබ ආයතනයට සම්බන්ධව ක්‍රියාකරන අනුමත ආගමික පූජක තුමන්ලාගේ සේවය වඩාත් කාර්යක්ෂමතාවයෙන් යුතුව ලබා ගැනීමට ක්‍රියාකරන ලෙසටත්, විශේෂයෙන්ම ඔබ ප්‍රදේශයේ පිළිගත් සමාජ හිතකාමී අනුමත ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන වල සහාය ලබාගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙසටත්,

II. නේවාසිකයින් උදෙසා සාර්ථක උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශය, ප්‍රාදේශිය ලේකම් කාර්යාල සහ පිළිගත් අනුමත ස්වේච්ඡා සංවිධාන වල වෘත්තියමය උපදේශකයින් සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙසටත්, දන්වන අතර මගේ අංක :- ඩබ්/දෛනි.කා.ස/2013 හා 2013.12.31 දිනැතිව චක්‍රලේඛ අංක:- 49/2013 බන්ධනාගාර ආයතන සඳහා දෛනික කාල සටහනක් සැකසීම - 2014 මැයෙන් නිකුත් කරන ලද චක්‍ර ලේඛයෙන් ඔබවෙත සපයා ඇති දෛනික කාළ සටහනට සමගාමීව මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට වගබලා ගන්නා ලෙසටද දන්වමි.

5. මේ සම්බන්ධව ඔබ ගත් ක්‍රියාමාර්ගය හා ප්‍රගතිය සම්බන්ධව 2014.02.10 වෙනි දිනට පෙර මාවෙත වාර්තා කලයුතු බව වැඩිදුරටත් දන්වමි.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

පිටපත් :-

01. ලේකම්
පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
කොළඹ 08

02. අතිරේක ලේකම් (සංවර්ධන)
පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
කොළඹ 08

} කා.දැ.පි.